015

සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## අවසාන වාර පරීක්ෂණය - 2018

## 09 - ශ්‍රේණිය

## ඉතිහාසය

නම/විභාග අංකය :- ........................................................ කාලය: පැය 02 යි.

I කොටස

සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

- අංක 01 සිට 20 තෙක් නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

(01) ''ජොරිස් වැන් ස්පිල් බර්ජන්'' නම් ලන්දේසි ජාතික අද්මිරාල්වරයා ලංකාවට පැමිණෙන විට තත්ද උඩරට පාලකයා කවුරුන් ද?

(1) පළමුවන රාජසිංහ රජතුමා (2) දෙවන රාජසිංහ රජතුමා

(3) පළමුවන විමලධර්මසූරිය රජතුමා (4) සෙනරත් රජතුමා

(02) ශ්‍රී වීර පරාක්‍රම නරේන්ද්‍රසිංහ රජුගේ පාලන සමයේ දී හොරතේලියස් වැකල් නම් ලන්දේසි දූතයා උඩරටට පැමිණීමට බලපෑ හේතුව වන්නේ,

(1) රජුගේ බිසව මියයාම ගැන ශෝකය පළ කිරීමට ය.

(2) රජු බැහැදකින ලෙස ලැබුණු ආරාධනාවක් අනුව ය.

(3) රජු හා ලන්දේසීන් අතර නව ගිවිසුමක් ඇතිකර ගැනීමට ය.

(4) වෙළෙඳ කටයුතු පිළිබඳ ව සාකච්ඡා කිරීමට ය.

(03) ලන්දේසීන්ගේ පෙරදිග මූලස්ථානය ලෙස යොදා ගත්තේ කුමන ස්ථානය ද?

(1) මදුරාසිය (2) කොළඹ කොටුව (3) පොන්ඩිචෙරි (4) බටාවිය

(04) ශ්‍රී ලංකාවේ මුහුදුබඩ ප්‍රදේශවල දේශපාලන බලය පිහිටුවා ගත් යුරෝපා ජාතීන් අතුරින් උඩරට රාජ්‍ය සමග වැඩි කාලයක් යහපත් සම්බන්ධතාවක් පැවැත්වූයේ,

(1) පෘතුගීසීන් (2) ලන්දේසීන් (3) ඉංග්‍රීසීන් (4) ප්‍රංශයින්

(05) ක්‍රි.ව. 1797 දී මුහුදුබඩ ප්‍රදේශවල ආරම්භ වූ ඉංග්‍රීසි විරෝධී කැරැල්ලට හේතුවක් නොවන්නේ මින් කුමක් ද?

(1) මුදලිම් පතනින් ඉඩම් අහිමි වීම.

(2) ඉංග්‍රීසි වෙළෙඳ සමාගම නව බදු වර්ග කිහිපයක් ඇති කිරීම.

(3) බදු එකතු කිරීමට මදුරාසියෙන් නිලධාරීන් ගෙන්වා ගැනීම.

(4) භාණ්ඩවලින් බදු ගෙවීම වෙනුවට මුදලින් බදු ගෙවීමට සිදු වීම.

(06) බ්‍රිතාන්‍ය පාලන සමයේ දී මෙරට වගාකරන ලද මුල්ම වතු භෝගය වන්නේ,

(1) තේ (2) කෝපි (3) පොල් (4) රබර්

(07) කර්නල් ද මිපුරන් පටතේ ''මිපුරන් කොමිසම'' පත් කර එවීමට බලපෑ ප්‍රධානතම හේතුව කුමක් ද?

(1) ද්විත්ව පාලනය අසාර්ථක වීමට හේතුව සොයා බැලීමට

(2) 1803 ඉංග්‍රීසීන්ගේ උඩරට ආක්‍රමණය අසාර්ථක වීමට හේතු සොයා බැලීමට

(3) 1797 දී මුහුදු බඩ ඇති වූ කැරැල්ලට හේතු සොයා බැලීමට

(4) ලංකාවේ ආදායමට වඩා වියදම් ඉහළ ගොස් තිබීමට හේතු සොයා බැලීමට

(08) ලංකාවේ බෞද්ධ පුනරුද සමයේ බුලත්ගම ධම්මාලංකාර සිරි සුමන තිස්ස හිමියන් විසින් ආරම්භ කරන ලද මුද්‍රණාලය කුමක් ද?

(1) කවටකතිත මුද්‍රණාලය (2) ලංකෝපකාර මුද්‍රණාලය

(3) ලංකාභිනව විශ්‍රැත මුද්‍රණාලය (4) සුදර්ශන මුද්‍රණාලය

(09) ඉරු දින දහම් පාසල් ආරම්භ කිරීමට පුරෝගාමී වූ නායකයා වන්නේ,

(1) වලිසිංහ හරිස්චන්ද්‍ර මහතා ය. (2) අනගාරික ධර්මපාල තුමා ය.

(3) මිගෙට්ටුවත්තේ ගුණානන්ද හිමි ය. (4) හෙන්රි ස්ටීල් ඕල්කට් තුමා ය.

(10) ආසියාවේ ලන්දේසි බලය පැතිරවීමේ කාර්යයේ දී වැදගත් වන ලන්දේසි ජාතිකයා ලෙස සැලකෙන්නේ කවු ද?

(1) අල්බුකර්ක් (2) පීටර්සර් කූන් (2) ජෙරාඩ් හල්ෆට් (4) කලන් අල්මිස්

(11) ඉන්දියානු ප්‍රදේශවල නීත්‍යානුකූල රාජ පරපුරකට අයත් රාජ්‍ය උරුමකරුවකු නොමැති ව පාලකයා මිය ගිය විට එම රාජ්‍යයන් වෙළෙඳ සමාගමට අයත් වූයේ.

(1) උපකාර ගිවිසුම් ක්‍රමය අනුව (2) රෙග්ලේට් පනත අනුව

(3) අස්වාමික න්‍යාය අනුව (4) මෝලි මින්ටෝ ප්‍රතිසංස්කරණය අනුව

(12) සිපොයි කැරල්ල ආරම්භ වීමට බල පෑ ආසන්නතම හේතුව කුමක් ද?

(1) ඉංග්‍රීසින් මිෂනාරීන්ට උදව් කිරීම

(2) ඉන්දිය ප්‍රදේශ අත්පත් කර ගැනීමේ දී අනුගමනය කළ ප්‍රතිපත්තිය

(3) එන්ෆීල්ඩ් නම් රයිෆල් භාවිතය ප්‍රතික්ෂේප කිරීම නිසා ඔවුන්ට දඬුවම් කිරීම

(4) වෙළෙඳ සමාගමේ ආර්ථික ප්‍රතිපත්තිය නිසා දේශීය කර්මාන්ත බිඳ වැටීම

(13) ඉන්දිය ජාතික සංගමයේ ආරම්භක සභාපතිවරයා ලෙස පත් වූයේ,

(1) දදාබායි නාඕරෝජි ය. (2) මංගල් පාණ්ඩේ ය.

(3) සුරේන්ද්‍රනාත් බැනර්ජි ය. (4) ඩබ්. සී. බෙනර්ජි ය.

(14) කෝල්බෲක් කොමිසම ලංකාවට පැමිණීමට බල පෑ ප්‍රධානතම හේතුව කුමක් ද?

(1) ලංකාවේ ආදායමට වඩා වියදම වැඩිවීම නිසා

(2) වතු වගාව දියුණු කිරීමට පිළිබඳව සොයා බැලීමට

(3) මුහුදුබඩ ප්‍රදේශවල ඇති වූ කැරලිවලට හේතු සොයා බැලීමට

(4) ලංකාවට සුදුසු ආණ්ඩුක්‍රමයක් ලබා දීම සොයා බැලීමට

(15) ව්‍යවස්ථාදායක සභාවට ප්‍රථමයෙන් ම පත් වූ උගත් ලාංකිකයා වන්නේ,

(1) පොන්නම්බලම් අරුණාචලම් මහතා ය. (2) පොන්නම්බලම් රාමනාදන් මහතා ය.

(3) ආරුමුගම් පිල්ලේ මහතා ය. (4) ඩී.එස්. සේනානායක මහතා ය.

(16) ශ්‍රී ලංකාවට සර්වජන ඡන්ද බලය ලබා දුන් ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණය කුමක් ද?

(1) කෲව් මැකලම් (2) මැනිං (3) මැනිං ඩෙවොන්ෂයර් (4) ඩොනමෝර්

(17) ශ්‍රී ලංකාවේ අග්‍රාණ්ඩුකාරවරයා ලෙස මුලින්ම පත් වූයේ,

(1) හෙන්රි මොසන් මුවර් ය. (2) සර් ෆ්‍රෙඩ්රික් නෝර්ත් ය.

(3) ඩී.එස්. සේනානායක (4) විලියම් ගොපල්ලව මහතා ය.

(18) "අ" තීරුව "ආ" තීරුව හා ගලපා නිවැරදි පිළිතුර තෝරන්න.

| "අ" | "ආ" |
|---|---|
| 1. උඩරට හා පහතරට ඒකාබද්ධ කිරීම | A. කෲව් මැකලම් |
| 2. සීමිත ඡන්ද බලය හඳුන්වා දීම | B. සෝල්බරි |
| 3. අග්‍රාණ්ඩුකාර ධුරය හඳුන්වා දීම | C. කෝල්බෲක් |
| 4. නිල නොලත් මන්ත්‍රීන් බහුතරය වීම | D. මැනිං |

(1) ABCD (2) CABD (3) CDBA (4) DCAB

(19) වර්තමාන ශ්‍රී ලංකාවේ ඉහළම හා අවසාන අභියාචනාධිකරණය කුමක් ද?

(1) අභියාචනාධිකරණය (2) මහාධිකරණය

(3) දිසා අධිකරණය (4) ශ්‍රේෂ්ඨාධිකරණය

(20) මහවැලි සංවර්ධන යෝජනා ක්‍රමය ආරම්භ කරන ලද්දේ,

(1) පොල්ගොල්ල ව්‍යාපාරයෙනි. (2) මාදුරු ඔය ජලාශ ව්‍යාපාරයෙනි.

(3) වික්ටෝරියා ව්‍යාපාරයෙනි. (4) කොත්මලේ ඔය ව්‍යාපාරයෙනි.

## II කොටස

- පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.

(01) (අ) ඔබට සපයා ඇති ශ්‍රී ලංකා සිතියමේ දක්වා ඇති අක්ෂරවලට අදාළ නම් පහත ලැයිස්තුවෙන් තෝරා ඔබේ පිළිතුරු පත්‍රයේ ලියන්න.

(i) මහනුවර


(ii) මීගමුව

(iii) කල්පිටිය

(iv) ත්‍රිකුණාමලය

(v) ගාල්ල

(vi) මාතර




(ලකුණු 06)

(ආ) 

(i) රූපයෙන් දක්වෙන පුද්ගලයා නම් කරන්න.

(ii) මෙතුමා විසින් ආරම්භ කරන ලද දේශපාලන පක්ෂය කුමක් ද?

(iii) 1956 මහ මැතිවරණයේ දී මෙතුමාට සහාය දුන් බලවේගය කුමක් ද? (ලකුණු 06)



(ඇ) (i) මෙම රූපයෙන් දක්වෙන නිර්මාණය කුමක් ද?

(ii) මෙම නිර්මාණය කරවන ලද පුද්ගලයා නම් කරන්න.

(iii) මෙය පිහිටා ඇති රට කුමක් ද? (ලකුණු 06)

(02) (i) පහත සඳහන් සිද්ධීන්ට සම්බන්ධ පුද්ගලයන් කවුරුන් ද යි පිළිවෙලින් සඳහන් කරන්න.

A - 1638 දී ලන්දේසීන් සමග ගිවිසුමකට එළඹීම

B - රාජ්‍ය උරුමය අනුව පෘතුගාලයේ රජු බවට පත් වූ ස්පාඤ්ඤයේ රජතුමා.

C - 1762 දී උඩරට රජු හමුවට පැමිණි ඉංග්‍රීසි දූතයා. (ලකුණු 03)

(ii) ලන්දේසීන් විසින් ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක කරන ලද නව උපාධි වර්ග හතරක් සඳහන් කරන්න. (ලකුණු 04)

(iii) ශ්‍රී ලංකාවේ ලන්දේසි පාලනයට යටත් ප්‍රදේශවල ක්‍රියාත්මක වූ ආර්ථික කටයුතු කරුණු දෙකක් මගින් කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 05)

(03) (i) 1803 වර්ෂයේ දී ෆ්‍රෙඩ්රික් නෝත් ආණ්ඩුකාරයා උඩරට රාජ්‍ය ආක්‍රමණය කිරීමට බලපෑ හේතු තුනක් සඳහන් කරන්න. (ලකුණු 03)

(ii) A - 1818 දී නිදහස් අරගලයට සම්බන්ධ සිංහල නායකයන් දෙදෙනෙක් නම් කරන්න.

B - 1818 දී නිදහස් අරගලය අසාර්ථක වීමට බලපෑ හේතු දෙකක් ලියන්න. (ලකුණු 04)

(iii) 1848 දී උඩරට දෙවන නිදහස් අරගලය ආරම්භ වීමට බලපෑ ප්‍රධාන හේතු දෙකක් කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 05)

(04) (i) මිෂනාරීන් විසින් ඔවුන්ගේ ආගම ප්‍රචාරය කිරීම සඳහා අනුගමනය කළ ක්‍රියාමාර්ග තුනක් සඳහන් කරන්න. (ලකුණු 03)

(ii) බෞද්ධ පුනර්ජීවන ව්‍යාපාරය පැවැති සමයේ දී එහි නායකයන් විසින් අනුගමනය කළ ක්‍රියාමාර්ග දෙකක් ලියා දක්වන්න. (ලකුණු 04)

(iii) A - බෞද්ධ පුනර්ජීවන ව්‍යාපාරය සම්බන්ධයෙන් හෙන්රි ස්ටීල් ඕල්කට් තුමාගෙන් ඉටු වූ සේවාවන් තුනක්.

B - හින්දු පුනර්ජීවන ව්‍යාපාර සමයේ ආරුමුගර් නාවලර් තුමාගෙන් ඉටු වූ සේවාවන් දෙකක් බැගින් සඳහන් කරන්න. (ලකුණු 05)

(05) (i) ඉන්දියානුවන් තුළ දේශානුරාගය වර්ධනය වීමට බලපෑ හේතු තුනක් ලියන්න. (ලකුණු 03)

(ii) ඉන්දීය ජාතික ව්‍යාපාරය හා සම්බන්ධ ප්‍රකාශ කිහිපයක් පහත දක් වේ. ඊට සම්බන්ධ පුද්ගලයන් කවුරුන් ද යි වරහන් තුළින් තෝරා ලියන්න.

A - ඉන්දියාවේ "සම්භාවනීය මහල්ලා" යන අන්වර්ථ නාමයෙන් හැඳින් වූ පුද්ගලයා,

B - "ස්ව රාජ්‍ය යනු මගේ ජන්ම උරුමය යි" යනුවෙන් ප්‍රකාශ කළේ,

C - අවිහිංසාවාදී සටන නිසා සමස්ත ලෝක ජනතාව අතර ම ප්‍රසිද්ධියට පත් වූ ඉන්දීය නායකයා,

D - පාකිස්ථානය යනුවෙන් වෙන ම රටක් පිහිටුවා ගැනීමට කටයුතු කිරීම (බාල්ගංගාධර් තිලක්, ගාන්ධි තුමා, දාදාභායි නවරෝජි, මව්ලානා අබ්දුල් කලාම් අසාද්, මොහොමඩ් අලි ජින්නා) (ලකුණු 04)

(iii) ඉන්දීය නිදහස් සටන අඩපණ කිරීමට ඉංග්‍රීසීන් අනුගමනය කළ ක්‍රියාමාර්ග දෙකක් පැහැදිලි කරන්න. (ලකුණු 05)

(06) (i) පහත දක්වෙන වර්ෂවල දී ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වූ ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ මොනවා ද යි පිළිවෙලින් ලියා දක්වන්න.

A. 1833 B. 1931 C. 1947 (ලකුණු 03)

(ii) පහත දක්වෙන සිදුවීම් සම්බන්ධ පුද්ගලයින් වරහන තුළින් තෝරා ලියන්න.

A - ලංකා ජාතික සංගමයේ මුල් ම සභාපතිවරයා

B - 1908 දී විධිමත් සන්දේශයක් යටතේ විජිත භාර ලේකම් වරයාට ඉදිරිපත් කිරීම

C - රාජ්‍ය මන්ත්‍රණ සභාවේ ප්‍රථම කථානායකවරයා

D - 1865 දී ලංකා සංගමය පිහිටුවීමට මූලිකත්වය ගැනීම (පොන්නම්බලම් රාමනාදන්, පොන්නම්බලම් අරුණාචලම්, A.F. මොලමුරේ ජේම්ස් වෝල්, සර් ජේම්ස් පීරිස්) (ලකුණු 04)

(iii) A - ඩොනමෝර් ආණ්ඩුක්‍රමයේ ප්‍රධාන ලක්ෂණ තුනක් සඳහන් කරන්න.

B - සෝල්බරි ආණ්ඩුක්‍රමයේ ප්‍රධාන ලක්ෂණ දෙකක් සඳහන් කරන්න. (ලකුණු 05)

(07) (i) A - 1953 දී ඇති වූ "හර්තාලය" හේතුවෙන් එම තනතුරෙන් ඉල්ලා අස් වූ අගමැතිවරයා

B - ලොව ප්‍රථම අගමැතිනිය වීමේ භාග්‍ය ලද කාන්තාව

C - 1972 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අනුව ජනාධිපති තනතුරට පත් වූ පුද්ගලයා A, B, C අනුපිළිවෙලින් ලියන්න. (ලකුණු 03)

(ii) 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අනුව ජනාධිපතිවරයාට පාර්ලිමේන්තුව සම්බන්ධයෙන් හිමි බලතල දෙකක් ලියන්න. (ලකුණු 04)

(iii) "නිදහසින් පසු බලයට පත් සෑම ආණ්ඩුවක් ම වී ගොවිතැන දියුණු කිරීමට කටයුතු කර ඇත. ඒ සඳහා අනුගමනය කළ ක්‍රියාමාර්ග දෙකක් කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 05)